24 වන පිටෙන්

ද, පූජනීය කටයුතු රැසක් සිදු වේ. "භාර භාර" ජපන් ආගමික සම්ප්‍රදාය තුළ වැදගත් තැනක් උසුලයි. ජපන් බසින් විවිධ පාඨ ලියූ පුවරු (tablets) රැසක් මෙම පූජනීය ස්ථානවල විශේෂ ස්ථානවල එල්ලා තිබුණි. ඒවා තම අනාගත ප්‍රාර්ථන සඵල කර ගැනීම සඳහා කරන ලද ඒවා විය. "සාකේ" නැමැති සම්ප්‍රදායික බීම වලින් දෙවියන්, හා මළවුන් පිදීමෙන් ද ඔවුන් තම ප්‍රාර්ථනා සඵල කර ගත හැකි බව විශ්වාස කළහ. සෑම පූජනීය ස්ථානයකම පාහේ ඇති දිය තටාකයෙන් දිය බිඳක් පානය කර අල්තාරයට කාසියක් විසිකර තෙවරක් අත්පොළසන් දීමෙන්, තම ප්‍රාර්ථනා ඉටුවෙතැයි ඔවුහු සිතති.

කියෝටෝහි තිබූ සෙන් සහ ෂින්ටෝ ධර්මයට අයත් පූජනීය ස්ථාන රැසක් නැරඹීමට අපට හැකි විය. සෑම පූජනීය ස්ථානයක්ම වටකර, සුවිසල් උයන්වතු දැකිය හැක. " කින්කායුජි පන්සලට (Kinkauji Temple) මේ අතර වැදගත් ස්ථානයක් ගනී. මෙහි බුදුන්ගේ භෂ්මාවශේෂ තැන්පත් කර ඇතැයි විශ්වාස කරන අතර, උඩු මහලේ බිත්ති රනින් ආලේප කර ඇත. එම ස්ථානයට යෑමට අවසර නොමැති නිසා ඈතින් සිට අපි එය නැරඹීමු.

කියෝටෝවලට එන සංචාරකයින්ට අසන්නට ලැබෙන වචනයකි "Tea - Ceremony" යන්න. මොකක්ද මේ අමුතු උත්සවය ? මේ ගැන මීට පෙර නොඇසූ මා තුළ ඇතිවූයේ එක්තරා කුතුහළයකි. අප නැරඹූ උද්‍යාන, පූජනීය ස්ථානවල විශේෂ භූමි භාගයක "Tea Houses" නමින් හැඳින්වූ, සම්ප්‍රදායානුකූල ලෙස නිමවුනු නිවාස ද විය. එයින් අපට හැඟී ගියේ මෙම "Tea Houses සහ Tea Ceremony" ජපන් සංස්කෘතියට ආවේනිකවූ උත්සව විශේෂයක් බවයි. මෙම තේ පානය කිරීමේ උත්සවයට ඇත්තේ අවුරුදු 1000 ක් පමණ පැරණි ඉතිහාසයකි. නව වැනි සියවසේදී චීනයට ගිය බෞද්ධ භික්ෂුහු ජපානයට "තේ පැලය" හඳුන්වා දුන්හ. කඳුකර ප්‍රදේශවල ජීවත් වූ භික්ෂුන්ට ශීත ඍතුවේදී ඇතිවන රෝගවලට ඖෂධයක් මෙන්ම, චෛතසික පාරිශුධිය වඩවන බීමක් ලෙසත් මෙය ප්‍රයෝජනවත් විය. තමන් වගා කළ, තේ පැලවල හටගත් ලා දලු අඹරා බීමට ගැනීම ආගමික උත්සවවලදී විශේෂ ස්ථානයක් ගත්තේ ය. අදත් ජපානයේ ජනප්‍රිය " Green Tea", කොළ පැහැති තේවල උපත ඇති වූයේ එලෙසය. කියොටෝ හි පැවති දේශගුණය තේ පැලයට හිත කර විය. තේ වගාව ඉක්මනින් පැතුරිනි. කල් යත්ම කියෝටෝහි සිටි ජපන් අධිරාජයා ඇතුළු ප්‍රභූන්ගේ උසස් බීමක් ලෙස තේ පානය පත් වුනි. Tea ceremony නමින් විශේෂ උත්සවයක් ද, Tea House යනුවෙන් නිවසක් ද බිහි විය. කියෝටෝ මෙම උත්සව වලදී ප්‍රධාන ස්ථානය ගත්තේ ය. අදත් එම ස්ථානය කියෝටෝ හිමි කර ගෙන ඇත.

කියෝටෝ නගරයෙහි සිටි කාලය තුළ අපට ද මෙවැනි උත්සවයකට සහභාගී වීමට හැකි විය. "Tea House" නැමැති එම නිවසට පැමිණෙන අමුත්තන්ට වාඩි වීමට "ටටාමි" (Tatami) නමින් විශේෂ පන් වර්ගයකින් සෑදු පැදුරකි. කලබලයකින් තොරව අමුත්තන් එහි වාඩිවෙති. ඇතුළට ඒමට පෙර පාවහන් ගැලවිය යුතුය. සම්ප්‍රදායානුකූලව කිමෝනාවලින් සැරසුන ජපන් කාන්තාවන් කිහිප දෙදෙනෙකු වැඩ කටයුතු අරඹයි. වතුර උණු කිරීම, තේ පිළියෙළ කිරීම ආදී සියල්ල එක්තරා ක්‍රමයකට සිදු වෙයි. ඒ සඳහාම වෙන් වූ භාජන රැසකි. පිළියෙළ කරන තේ ඉතාම අචාරශීලීව, දෙඅතින් අල්වා අමුත්තන්ට පිළිගන්වති. අමුත්තෝ ද හිස නමා දෑතින් එය පිළිගනිති. දෑතින්ම ගෙන පානය කරති. ඉතාම සෙමින්, එක්තරා ලතාවකට එය පානය කළ යුතු බව, ඇය අපට පෙන්වා දුන්නේය.

කියෝටෝ සිට ෂන්කාන්සෙන් දුම්රියෙන් අපට හිරෝෂිමාවට යෑමට ගත වූයේ පැ. 1 මි. 45 වැනි සුළු කාලයකි. උදේ නවයට පමණ හිරෝෂිමා දුම්රිය පොළට ගිය අපි, බස්රථයකින් හිරෝෂිමා නගරයෙහි සාමයේ සිහිවට උද්‍යානය (The Peace Memorial Park) කරා ගමන් කළෙමු. හිරෝෂිමාව ඉතාම සෞභාග්‍යමත්, ගහ කොලින් පිරි, සුවිසල් නගරයකි. මග දෙපස මලින් බරවූ සකුරා ගස්, සුවිසල් ගොඩනැගිලි නගරය අලංකාර කළේය. උදය කාලය නිසා නගරය තුළ එක්තරා කඩිසර බවක් දක්නට ලැබුණි. එකවරම මගේ මනස 1945 අගෝස්තු 06 වැනිදා උදේ 8.15 වෙත ඇදී ගියේය. එදත් අද මෙන් සුන්දර උදෑසනක, කවුරුත් දවස ආරම්භ කරන්න සිතන්න ඇති. නමුත් ඔවුන් තම ආදරණීය නගරයක්, එහි ජීවත් වූ දහස් ගණන් ජනතාවත් ප්‍රථම වරට මිනිස් සංහාරයක් සඳහා බිම හෙලන පරමාණු බෝම්බයක බිල්ලක් වෙතැයි සිහිනෙන්වත් පවා නොසිතන්න ඇති. නමුත් එම ඛේදවාචකය සිදුවිය. අහසේ මඳ වේලාවක්, මහත් ආලෝක ධාරාවක් පතුරවමින් කැරකෙමින් තිබුණ, මහා බරැති මෙම පරමාණු බෝම්බය, මහත් ආලෝක ධාරාවක් පතුරවමින්, මහා ඝෝර නාදයකින් මුලු පෙදෙසම දෙවනක් කරමින් බිම ඇද හැලුනි. F $1000^0$ ක පමණ රශ්මියකින් යුත් ගිනිදැල් මුලු නගරයම අළු කලේය. 40,000 දහසක පමණ මිනිස්සු එතැනම මිය ගියහ. ගොඩනැගිලි, ගහ කොළ, පිලිස්සෙමින් බිම හැද හැලුනි. සමහරු සුන්බුන් වලට යටවී තුවල ලැබූහ. ඇතැමෙක් එතනම මිය ගියහ. දිවි ගලවා ගත් අය උමතු වෙසින් ඒ මේ අත දිවූහ. සුන්දර හිරෝෂිමාව අමු සොහොන් පිටියක් බවට පත්විය. දෙවන ලෝක මහා යුද්ධය අවුරුදු ගණනක් පුරා දිගින් දිගටම කෙරුනි. දෙපක්ෂයෙන්ම මිය ගිය ජනතාව අපමණය. පැසිපික් ප්‍රදේශයේ බලවතා ජපානය විය. ඔවුන්ගේ යුධ හමුදා මූලස්ථානය, දේශපාලන, හා ආර්ථික මධ්‍යස්ථානය හිරෝෂිමාව විය. ජපානය නිහඬ කිරීමට "පරමාණු බෝම්බය" හෙලීමට සුදුසුම ස්ථානය හිරෝෂිමාව බව ඇමරිකානුවන්ට ඒත්තු ගියේය. එසේම එහි පිහිටීම ද එබදු ව්‍යසනයකට වඩා සුදුසු බවද ඔවුහු අවබෝධ කරගත්හ.

පරමාණු බෝම්බයට හසු වී  මිය ගිය, රෝගාතුර වූ සහ අංග විකලත්වයට පත්වූ අය දස දහස් ගණනකි. අදත් එහි කිරණ වැදී විවිධ රෝගවලට ගොදුරු වූ අය ආරෝග්‍ය ශාලාවන්හි ප්‍රතිකාර ලබති. මෙම සියළුම පීඩා විදින ජනතාව වෙනුවෙන් 1954දී "Peace Memorial Park" යනුවෙන් එදා පරමාණු බෝම්බය ඇදහැළුන ස්ථානය විශේෂ උද්‍යානයක් බවට පත් කරන ලදී. නගර මධ්‍යයෙහි අක්කර විශාල ප්‍රමාණයක් පුරා පැතිරුණ මෙම මහා උද්‍යානය, පරමාණු බෝම්බයට ගොදුරු වූ දස දහසක් ජනතාව වෙනුවෙන් තනන ලද විශේෂ ස්මාරක ගොඩනැගිලි, කෞතුකාගාර ආදියෙහි පරිපූර්ණව පවතී. "එදා සිදු වූ ඒ මහා විනාශය දැක ගැනීමට පැමිණි විශාල පිරිසකගෙන් මෙම භූමිය පිරී තිබුණි.

මෙම සාමයේ සිහිවටන උද්‍යානයට ගිය වහාම අප දුටුවේ එදා පරමාණුවට කෙළින්ම ගොදුරු වූ ගොඩනැගිල්ලක ඉතුරු වූ සුන්බුන්ය. හිරෝෂිමාවේ කාර්මික ප්‍රවර්ධන ශාලාවට (Hiroshima Industrial Promotion Hall) මීටර් 600ක් උඩ සිට කෙළින්ම මෙම ගොඩනැගිල්ල මත පරමාණු බෝම්බය පතිත විය. හරියටම කෙළින්ම, ගොඩනැගිල්ල වෙත එල්ලවූ නිසා, ගොඩනැගිල්ලේ ඇතුළත දෙදරා ගොස් අළු විය. එහි සිටි සිය දහස් ජනතාව එතැනම මිය ගියේය. නමුත් ගොඩනැගිල්ලෙහි බාහිර බිත්ති ඉතා ශක්තිමත් ලෙස සෑදු ඝනකම් බිත්තිවලින් වැඩි කොටසක් සහ එහි මුදුනත තිබුණු වානේ වලින් නිම කල ඩෝමය (Dome) පමණක් ඉතුරුවිය. "Atomic bomb dome" යනුවෙන් අද හඳුන්වනේ එදා විනාශ වූ ඒ සුවිසල් ශාලාවෙහි ඉතුරු වූ කොටස්ය.

දෙවන මහා ලෝක යුද්ධයෙන් ජපන් ජාතිකයෝ රැසක් මිය ගියහ. බොහෝ දෙනෙකුට අනිවාර්යයෙන් යුද සේවයට බැඳීමට සුදුවිය. ශ්‍රම සුන්‍යතාවයක් රටේ අත්‍යවශ්‍ය සේවාවක් ක්‍රියාත්මක කිරීමට පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් යොදවන ලදී. හිරෝෂිමාවට පරමාණු බෝම්බය පතිත වන විට සේවයේ යෙදී සිටී තරුණ ග්‍රාමක පිරිස විශාල සංඛ්‍යාවකි. ඔවුන් දහස් ගණනක් පරමාණුවට ගොදුරු වූහ. ඔවුන් වෙනුවෙන් "Memorial for the Mobilized Children" යනුවෙන් මීටර් 12 උස, පස්මහල් දැවැන්ත ස්මාරකයක් 1967 තනන ලදී. ස්මාරකය පාමුල " සාමයේ දෙවඟන පිළිරුවකි. බෝම්බයෙන් ඉතිරි වූ ඔවුන්ගේ සහායකයෝ මාස් පතා මල් පහන් පුදා ඔවුන් සිහිකරති. දෙවඟන අබියස දැල්වෙන සුවඳ දුම් කූරු, සහ මල් අපටද දකින්නට ලැබුණි.

උද්‍යානයෙහි හරි මැද, බෝම්බය නිසා මිය ගිය සියළු දෙනා වෙනුවෙන්, කොන්ක්‍රිට් වලින් තනා ඔප මට්ටම් කරන ලද මරණ ස්මාරකයකි. ආරුක්කුවක හෝ අශ්වයකුගේ සැදෑලයක් ලෙස උඩට නෙරා ගිය මෙහි යට කුහරයකි. 1952 දී නිමවන ලද මෙහි ඒ දක්වා බෝම්බයෙන් මිය ගිය අයගේ නම් සඳහන් කොට ඇත. ජපන් ජාතිකයන්ගේ හදවතින් ගලා ආ සිතුවිල්ලක් මෙහි සඳහන්ය " සියළුම මිය ගිය අයට සාමය උදාවේවා. මෙවැනි විනාශයක් ඔවුන් හෝ අප අතින් සිදු නොවේවා" මෙවැනි සිතුවිලි සෑම ස්මාරකයම දැකිය හැකිය.

මෙම ස්මාරකයට පිටුපසින් ඇති "සාමයේ ගිනි සිළුව" ද (Peace Flame) බෝමබ ප්‍රහාරයෙන් සහ යුද්ධයෙන් මිය ගිය අය වෙනුවෙන් කැප කර ඇත. 1964 නිම වූ මෙම ගිනි සිළුව එදා සිට දිවා රෑ සෑම දිනකම නොනවත්වා දැල්වේ. "න්‍යෂ්ටික අවි ආයුධ ලෝකයෙන් තුරන් වෙනතුරු අපි මෙය දල්වමු" යනුවෙන් ඇති වගන්තිය යුද කාමී ජාතිකයන්ට දෙන අනගි පණිවිඩයකි. මෙම උද්‍යානයෙහි Atomic Bomb Dome මිය ගිය අය වෙනුවෙන් තැනූ ආරුක්කුවක හැඩය ගත් ස්මාරකය, සහ මෙම සාමයේ ගිනි සළුම යන තුනම එකිනෙකට කෙළින් සිටින සේ නිම කර තිබුණි. නරඹන අයට අපූරු දර්ශනයකි එය.

උද්‍යානය මැද, අමතුම හැඩයකට නිර්මණය කළ උස දැවැන්ත ස්මාරකයකි. පරාමාණු බෝම්බයෙන් මිය ගිය, දරු දැරියන් වෙනුවෙන් තනා ඇති මෙම ස්මාරකය තුළ සැඟවී ඇත්තේ ඉතාමත් දූක්ඛිත කථාවකි. සඩාකෝ සසාකි (Sadako Saskai ) පරමාණු බෝම්බයට ගොදුරු වන විට දෑ අවුරුදු කුඩා දැරියකි. තම නිවසෙහි සිටි අය එහි තිබූ ජනේලයෙන්, පරමණුවේ කම්පනයට හසුවී කි. මී. 1 1/2 පමණ ඈතට විසිවී ගියාය. එම පහරින් ඇය මිය නොගියත් එම විශේෂ වායුව ඇගේ ශරීර ගත විය. නිසි වයසට පත් ඇය පාසල් ගිය නමුත් වයස අවුරුදු 12 වන විට, ලියුක්මියා නැමැති, ජපන් ජාතිකයන් "පරමාණු රෝගය" ලෙස හඳුන්වන දරුණු  සුවකිරීමට අපහසු රෝගයට ගොදුරු විය. (atomic bomb disease) එතැන් පටන් ඇය ජීවිතය ගත කළේ ආරෝග්‍ය ශාලාවෙහිය." යම් අයකු ඔරිගාමී ක්‍රමයට සාදන "ක්රේන්" 1000ක් සාදා නිම කළොත්, තමා සිතන පතන දෙය සාර්ථක වන්නේය" යන විශ්වාසක් ජපන් ජනතාව තුළ පැවතුනි. සසාකි, ඒ කුඩා දැරියගේ, ප්‍රතිවේධය වූයේ   "න්‍යෂ්ටික ආයුධ වලින් තොර ලෝකයක බිහිවීමය. රෝගීව ආරෝග්‍ය ශාලාවේ ගත කළ කාලයෙන් වැඩි කාලයක් ගත කළේ ඇය මෙම ක්රේන්ස් සෑදීමයි. ඇගේ යහළු යෙහෙළියන්ද ඇයට සහය දුන්හ. කඩදාසි මදිවූ විට විවිධ දේ ඔතා ඉවත ලන කඩදාසි පවා පාවිච්චි කළාය. නමුත් ඇයට සදා නිම කළ හැකි වූයේ ක්රේන්ස් 644 පමණි. 1955 ඔක්තොම්බර් 12 වැනිදා ඇය මිය ගියාය. ඇගේ මිතුරු මිතුරියන්, ඇයට නිම කළ නොහැකි කොටස සාදා නිම කළාය. ඇය වෙනුවෙන් ස්මාරකයක් සෑදිමට ලොව පුරා මුදල් ආධාර එකතු කළහ. 1958 මැයි 5 වැනිදා සාදා නිමකළ ස්මාරකයෙන් ඔවුන්ගේ ප්‍රාර්ථනය ඉටු විය. දෑත් අහසට නගා සාමයේ සංකේතයක් වන ක්රේන් එකක් ඔසවා සිටින සසාකිගේ පිළිරුවක් ස්මාරකය මුදුනේ ඇත. මැද බාහිර බිත්තිවල සුරංගනාවන් රැසකගේ පිළිරූය. එය සසාකි සහ ඈ මෙන් මිය ගිය දරු දැරියන් සිහිපත් කරයි. ස්මාරකය පාදකයෙහි මෙසේ සඳහන් වෙයි. "අප කෑ ගසා අඬන්නේ - යාතිකා ගයන්නේ - ලෝක සාමය ගොඩ නඟන්නයි" දර්ශනීය කොළ වලින් සෑදූ ක්රේන්ස් වලින් ස්මාරකය අවට පිරී ඇත. ළමා දිනය වෙනුවෙන්,  අවුරුදු පතා දහසක් ජපන් දරු දැරියන් සසාකි ඇතුළු මිය ගිය ඒ දරු දැරියන් සමරති.

ජනතාව, ගොඩනැගිලි, සතා සිවුපාවා මෙන්ම ගහ කොළ ද, පරමානුවට බිළි විය. අවුරුදු ගණනාවක් යනතුරු කිසිවක් වගා කළ නොහැකි නිසරු බිමක් ඉතුරු වුනි. 1972 දී ප්‍රතිරෝපණය කරන ලද "චීන කැසරෝල්" වෘක්ෂයක්, ඉතා ආරක්ෂිතව වැවෙන සැටි මෙම උද්‍යානයෙහිදී දැක්කෙමු. මීටර් 1300 පමණ ඈතින් තිබූ මෙම වෘක්ෂයෙහි පරමානු බෝම්බයට ඉලක්ක වූ කොටසෙහි විශාල සිදුරකි. නමුත් කෙසේ හෝ අනෙක් කොටස්වලට එය බල නොපෑ නිසා, ගස සෙමින් සෙමින් වැඩෙනු අප දුටුවෙමු.

සෑම අගෝස්තු මස 6 වැනි දිනකම පරමානු බෝම්බයෙන් විනාශයට පත් වූ අය වෙනුවෙන් විශාල අනුස්මරණ උත්සවයක් මෙම උද්‍යානයෙහි පැවැත්වේ. විවෘත වූ ආකතියක් මැද ඇති මෙම විශාල සීනුව, නැරඹීමට පැමිණෙන අයට නාද කළ හැක. ඒ හැර පරමානු බෝම්බය සමරණ දින මෙය ඇතුළු තවත් විශේෂයනේම ඒ සඳහා නිම වූ කුඩා සීනු කිහිපයක්  ද නාද කරති.

1958 ඇතිකළ හිරෝෂාමා කෞතුකාගාරය, හිරෝෂිමාවට පරමානු බෝම්බය වැටුනු පසු ඉතුරු වූ සුන්බුන් රැසක්, ගොඩනැගිලි ආදියේ ඉතිරිවූ ජනෙල් දොරවල් වල ලී, වීදුරු යකඩ ආදිය මෙන්ම ජනතාව පාවිච්චි කළ බයිසිකල්, පිඟන් කෝප්ප; ආදී භාණ්ඩ රැසක් ප්‍රදර්ශනය කරයි. මෙයට අමතරව සිත් කම්පා කරන ඡායාරූප රැසකි. බෝම්බය නිසා අංගවිකල වූවන්, පිළිස්සී නමුත් ජීවිතය ඉතුරු වූ අය ඔවුන්ගේ ලිපි, විස්තර ආදිය ද රැසකි.

හිරෝෂිමාවට එල්ල කළ පරමානු බෝම්බයට පසු කිසිම ඇමරිකානු ජනාධිපතිවරයෙකු තම නිළ කාලය තුළ හිරෝෂිමාවට නොපැමීය. එසේ තම නිළ කාලය තුළ එහි ගිය, මෙම සාමය සඳහා වූ උද්‍යානය නැරඹූ එකම ජනාධිපතිවරයා බැරැක් ඔබාමාය. 2016 මැයි මස එහි ගිය ඔහු, සාම සිහිවටන උද්‍යානයෙහි සංචාරය කළේය. විපතට පත් වූ අය මුණ ගැසුනි. ඔහු විසින් සාමය වෙනුවෙන් තැනූ ඔරිගාමි ක්රේන්ස් කිහිපයක් හිරෝෂිමා කෞතුකාගාරයේ ප්‍රද්ර්ශනයට තබා ඇත.

1946 අගෝස්තු 06 වැනිදා, හිරෝෂිමාවටත්, එම මස 09 වැනිදා නැවතත් නාගසාකි වලටත් හෙලූ බෝම්බයෙන් පසු ජපානය පරාජය පිළිගත්තේ ය. අගෝස්තු 15 වැනිදා තමා යටත්වෙන බව ජපන් අධිරාජ්‍යයා ප්‍රසිද්ධියේ පැවසීය.

දවස් ගණනක් පුරා අපි ජපානයේ ගත කළ කාලයෙන් ජපානය ගැන දැකගත් තොරතුරු රැසකි මේ. හිරෝෂිමාවෙන් අපි ගමන කෙළවර කළෙමු.